මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
MINISTRY OF FINANCE AND MASS MEDIA

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office - මුදල් / நிதி / Finance: (+94)-11-2484500, (+94)-11-2484600, (+94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax - මුදල් / நிதி / Finance: (+94)-11-2449823
කාර්යාලය / அலுவலகம் / Office - ජනමාධ්‍ය / வெகுசன ஊடக / Mass Media: (+94)-11-2513459, (+94)-11-2513498, (+94)-11-2512324
ෆැක්ස් / பெக்ஸ் / Fax - ජනමාධ්‍ය / வெகுசன ஊடக / Mass Media: (+94)-11-2513458
වෙබ් අඩවි / வெப் சைட்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk

මගේ අංකය / எனது இல. / My No. BD/CBP/4/1/2/2018
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2017.07.25

ජාතික අයවැය දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

*ජාතික අයවැය චක්‍රලේඛ අංක 2/2017*

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්

**අයවැය කැඳවීම - 2018**
**වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා මාර්ගෝපදේශ හා උපදේශ**

දැනට ක්‍රියාත්මක මූලධන ව්‍යාපෘති හා නව ආයෝජන සඳහා පහසුකම් සැලසීමට හා කඩිනම් කිරීමට මෙන්ම සංවර්ධන ප්‍රමුඛතා මත සම්පත් වෙන් කිරීම යතානුරූපීව පවත්වා ගෙන යාම සඳහා 2017.07.14 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුවට අනුකූලවන පරිදි 2018 වර්ෂය සඳහා අයවැය සකස් කිරීම සිදුකරනු ලැබේ.

අයවැය ක්‍රියාවලියට මධ්‍ය කාලීන දැක්මක් හඳුන්වාදීම මගින් එය වඩා උපායමාර්ගික හා රජයේ ප්‍රමුඛතාවන්ට අනුකූලවන ක්‍රියාවලියක් බවට පත්වේ. ඒ අනුව, රාජ්‍ය මූල්‍ය ප්‍රමුඛතා අනුව සැකසූ මධ්‍ය කාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුව හා ඇස්තමේන්තුගත සම්පත් සමඟ අයවැය ක්‍රියාවලිය සම්බන්ධ කළ හැකි අතර එමගින් අයවැය ක්‍රියාත්මක කිරීමේදී මූල්‍ය විනය ශක්තිමත් කිරීමට මෙන්ම රජයේ ප්‍රතිපත්ති හා ප්‍රමුඛතා සමඟ අයවැය වෙන් කිරීම හා වියදම් පෙළ ගැස්වීමට හැකිවේ.

මේ අතර අයවැය පිළියෙල කිරීමේ පුළුල් දැක්මට ඇතුලත් වන අවශ්‍යතාවයන් වනුයේ 2030 වන විට තිරසාර සංවර්ධන අරමුණු (Sustainable Development Goals) ලඟා කර ගැනීම දෙසට ගමන් කිරීමයි. (වර්ෂ 2015 එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් විසින් එකඟවූ තිරසාර සංවර්ධන අරමුණු ලැයිස්තුව **ඇමුණුම් 1** හි දක්වා ඇත.)

## 02. මධ්‍ය කාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුව

2018-2020 මධ්‍ය කාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුවේ ප්‍රධාන මූලිකාංග ලෙස පුනරාවර්තන වියදම් තාර්කිකරණය සහ මූලධන වියදම් ප්‍රමුඛතාගත කිරීම මෙන්ම රජයේ ආදායම් රැස්කිරීම ඉහළ නැංවීම හැඳින්විය හැක. එම මූලිකාංග අනුව 2020 වන විට රජය විසින් අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා සැලැස්ම පහත පරිදි දැක්විය හැකිය.

(i.) රජයේ ආදායම ද.දේ.නි යෙන් සියයට 16.5 ක් වීම
(ii.) රජයේ පුනරාවර්තන වියදම ද.දේ.නි යෙන් සියයට 14.8 ක් වීම
(iii.) රාජ්‍ය ආයෝජනය ද.දේ.නි යෙන් සියයට 5.3 ක් වීම
(iv.) අයවැය හිඟය ද.දේ.නි යෙන් සියයට 3.5 ක් වීම
(v.) රජයේ ණය ද.දේ.නියෙන් සියයට 70 ක් පමණ වීම

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ කාර්යසාධනයෙහි එවැනි ප්‍රගමනයන් තුළින් මධ්‍ය කාලීන ආර්ථික වර්ධනය සියයට 6 - 7 ක පමණ මට්ටමකට ළඟා කර ගැනීමට මෙන්ම උද්ධමනය මධ්‍ය තනි ඉලක්කමක් මත රඳවා ගැනීමට හේතු වනු ඇත.

2018 වසරට අදාලව ප්‍රධාන සාර්ව ආර්ථික පුරෝකථනයන් අතර සියයට 6 ක ආර්ථික වර්ධනය, උද්ධමනය සියයට 5 ක මට්ටමෙහි ස්ථායීවීම, අයවැය ප්‍රාථමික අතිරික්තය ද.දේ.නි යෙන් සියයට 1.2 ක් වීම හා සමස්ත අයවැය හිඟය ද.දේ.නි යෙන් සියයට 4.3 ක රඳවා තබා ගැනීම ඇතුලත්වේ.

## 3. කාර්යසාධනය මත පදනම් වූ අයවැයකරණ ක්‍රමවේදය

ඉදිරි වර්ෂයන්හි ඇතිවිය හැකි රාජ්‍ය මූල්‍ය කළමනාකරණ අභියෝග හා මෙරට සමාජ ආර්ථික සංවර්ධනය නංවාලීමේ අරමුණින් සිදු කරන සෑම අයවැය වෙන් කිරීමක්ම කාර්යක්ෂම හා ඵලදායී ලෙස වැය කිරීම සහතික කිරීමේ වැදගත්කම සැලකිල්ලට ගෙන, 2018 අයවැය, පසුගිය වර්ෂයන්හි ක්‍රියාත්මක කළ ශුන්‍ය පාදක අයවැයකරණ ක්‍රමයේ අත්දැකීම් මත පදනම්ව, කාර්යසාධනය මත පාදක වූ අයවැයකරණ ක්‍රමවේදය (Performance Based Budgeting Approach ) අනුව සම්පාදනය කෙරේ. 2016 හා 2017 වසර වලදී ශුන්‍ය පාදක අයවැයකරණ ක්‍රමවේදය යොදා ගැනීම, අයවැයකරණ ක්‍රමවේදය මැදිකාලීනව කාර්යසාධනය මත පාදක වූ ක්‍රමවේදයක් වෙත ක්‍රමිකව හැඩගැස්වීම සඳහා මනා ලෙස උපකාරී විය.

## 4. අවසන් ප්‍රතිඵලයන් හා ගලපන ලද ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs)

නිශ්චිතව නිර්ණය කළ හා මිනිය හැකි ප්‍රතිඵල ලඟා කර ගැනීම සඳහා සම්පත් වෙන්කිරීම කාර්යසාධනය පාදක වූ අයවැයකරණ ක්‍රමවේදය මගින් සිදු කෙරේ. එනිසා, කාර්යසාධනය මත පාදක වූ අයවැයකරණ ක්‍රමවේදයේදී මූල්‍ය වර්ෂය සඳහා ප්‍රධාන කාර්යසාධන දර්ශක නිර්වචනය කිරීම අවශ්‍ය වන අතර එම දර්ශක සම්පත් වෙන්කිරීම හා සම්බන්ධ කිරීම සමස්ථ අයවැය ක්‍රියාවලියේ එක් වැදගත් කොටසක් වේ. එහෙයින්, ව්‍යාපෘතිවල විෂය පථය හඳුනාගැනීම, අපේක්ෂිත මිනිය හැකි ප්‍රතිඵල නිර්ණය කිරීම සහ ව්‍යාපෘතිවල සමාජ ආර්ථික බලපෑම තක්සේරු කිරීම යනාදිය කාර්යසාධනය පාදක වූ අයවැයකරණ ක්‍රමවේදයේ ප්‍රධාන මූලිකාංග වේ.

## 5. මූලධන වියදම් උපයෝජනය

රාජ්‍ය මූල්‍ය කළමනාකරණයෙන් අපේක්ෂිත සමාජ ආර්ථික සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම දුර්වල කරමින්, රාජ්‍ය ආයතනවල මූලධන වියදම් උපයෝජනය සැලකිය යුතු ලෙස පහළ මට්ටමක පවතින බව 2016 සහ 2017 වසරේ මේ දක්වා කාලය තුළ නිරීක්ෂණය විය. මූලධන වියදම් උපයෝජනය පහළ මට්ටමක පැවතීමට ධාරිතා සීමාකම්, ප්‍රසම්පාදන ප්‍රමාදයන් සහ අළුතෙන් පැවරෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ඇති අඩු සූදානම ආදී කරුණු හේතු වී ඇති අතර, ව්‍යාපෘති සඳහා වෙන් කළ මහජන මුදල් උපයෝජනය නොකිරීම, රාජ්‍ය වියදම් කළමනාකරණයේ අරමුණු ඉටු නොවීමට මෙන්ම රටේ සමාජ ආර්ථික සංවර්ධනය අඩාල වීමටද හේතු වී ඇත.

## 6. සම්පත් වෙන් කිරීමේ පිළිවෙත

(i) "2017 වසර දිළිඳුකම පිටු දැකීමේ වසර" ලෙස අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රකාශයට පත් කිරීම අනුව රජයේ මූලික අරමුණු අතරින් එකක් වන්නේ දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමයි. ඒ අනුව, 2017 වසරේදී විශේෂයෙන් මොනරාගල, මුලතිව් වැනි අඩු සංවර්ධනයක් ඇති දිස්ත්‍රික්කයන්හි දැනටමත් ක්‍රියාත්මක ඉලක්කගත වැඩසටහන් ද ඇතුළුව දිළිඳුකම පිටු දැකීමේ වැඩසටහන් හා සම්බන්ධිත ගැටළු විසඳීම සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට විවිධ රේඛීය අමාත්‍යාංශ හරහා මූලික පියවර ගනු ලැබ තිබේ. එනිසා, දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති හරහා දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සෑම රේඛීය අමාත්‍යාංශයකම ලේකම්වරුන් විසින් කටයුතු කළ යුතුය.

(ii) මධ්‍ය කාලීන සමාජ ආර්ථික සංවර්ධනය වෙනුවෙන් අධ්‍යාපනය හා සෞඛ්‍ය අංශ ප්‍රමුඛ ක්ෂේත්‍ර ලෙස හඳුනාගෙන තිබේ. රාජ්‍ය හා පෞද්ගලික අංශයන් මගින් අධ්‍යාපනය වෙනුවෙන් කෙරෙන ආයෝජනය 2020 වන විට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6 කට ගෙන ඒමට අපේක්ෂිත අතර ඒ සඳහා අධ්‍යාපන අංශයේ වියදම් දැරීමේ ධාරිතාව කැපී පෙනෙන ලෙස පුළුල් විය යුතුවේ. අධ්‍යාපන හා සෞඛ්‍ය අංශ වෙත පෞද්ගලික අංශයේ ද විශාල ආකර්ෂණයක් ඇති වී තිබේ. එනිසා, රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වය ඇතිව මෙම අංශ සඳහා රජය විසින් ආයෝජන ඉහළ නංවනු ඇත.

අධ්‍යාපනය සඳහා කෙරෙන ආයෝජනයේදී ඉගැන්වීමේ හා ඉගෙනුම් අන්තර්ගතයේ ගුණාත්මක බව ඉහළ නැංවීම ඉලක්ක කළ යුතුය. අධ්‍යාපන ක්ෂේත්‍රයේ සමස්ත ගුණාත්මකභාවයේ වැඩිදියුණුවීමක අවශ්‍යතාවය බොහෝ කලක සිට ඇති වී තිබේ. එහෙයින්, ඉගැන්වීම් ක්‍රමවේදයන්, ඉගෙනුම් උපකරණ, ඉගෙනුම් පරිසරයන් හා ඒ හා සම්බන්ධිත අනෙකුත් සියළු අංශ අරමුණු කර ගත් ක්‍රියාමාර්ග ගත යුතුව තිබේ. එහිදී අධ්‍යාපන ක්ෂේත්‍රය, එහි ආයෝජන ප්‍රතිඵල (outcome) හා සම්බන්ධ කරමින් ඉහළ ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා උපායමාර්ග සැකසිය යුතුවේ. මෙම තත්වය යටතේ, ඉහළ ගුණාත්මක හා ප්‍රතිඵලාභිමුඛ සේවාවක් වෙනුවෙන් අධ්‍යාපන අංශයෙහි ප්‍රතිසංස්කරණ 2018 වසරේදී ආරම්භ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ.

2018 වර්ෂයේදී ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි රෝග වැලැක්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවධානය යොමු කළ යුතුය. බෝ නොවන රෝග පැතිරීම අඩු කිරීම සඳහා සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවකට සහ පාලනය හා වැලැක්වීම මත පදනම්ව සෞඛ්‍ය සේවා ප්‍රවර්ධන කාර්යයන් මගින් ප්‍රජාව බල ගැන්වීමට අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැගීමට පහසුකම් සැලසීම සඳහා අරමුදල් වෙන් කළ යුතුය. තවද, රජයේ අරමුදල් උපයෝජනයේදී වැය වන පිරිවැය පිළිබඳ මනා අවධානයක් සහ සංවේදීතාවක් ඇති කිරීම සඳහා උපකාරී වන ප්‍රතිසංස්කරණ සෞඛ්‍ය අංශය විසින් හඳුන්වා දිය යුතුය.

සෞඛ්‍ය අංශයේ වඩා හොඳ ප්‍රතිඵල සහතික කිරීම වෙනුවෙන් එම අංශයේ වියදම් දැරීමේ ධාරිතාව ඉහළ නංවා ගත යුතුවේ. වර්තමානයේදී බෝවන රෝගයන් අභිබවා බෝ නොවන රෝගයන් වර්ධනය වීම තුලින් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ගැටළු මතුවීමට පටන් ගෙන ඇත. එමනිසා බෝනොවන රෝග වැඩිවීමේ ප්‍රවණතාවය වලක්වාගැනීමට වැඩි වගකීමකින් කටයුතු කළ යුතුවේ. එසේම ඩෙංගු රෝගය පැතිරීම වැනි ගැටළු ද පාලනය කළ යුතුවේ.

(iii) අපේක්ෂිත ආර්ථික වර්ධන ගම්‍යතාවට සහය සලසනු සඳහා ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම්වල සීඝ්‍ර වර්ධනයක් අවශ්‍ය වේ. ඒනිසා, රජය විසින් යටිතල පහසුකම් ගොඩනැගීම සඳහා ආයෝජනය ඉහළ නැංවීමෙහි ලා වැඩි වැදගත්කමක් ලබා දී ඇති අතර එයින් වැඩි ප්‍රමාණයක් රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වය මත සිදු කෙරෙනු ඇත. විශේෂයෙන්ම, නාගරීකරණය, නිශ්චල දේපල සංවර්ධනය හා කාර්මික ජනපද පිහිටුවීම වැනි කටයුතු ඉහළ යෑම සමඟ උපයෝගිතා සේවාවල, විශේෂයෙන් විදුලිය ඉල්ලුමෙහි වැඩිවීමක් ඇති විය හැක. ඒනිසා, යටිතල පහසුකම් හා උපයෝගීතා සේවා සම්බන්ධයෙන් වර්ධනය වන්නා වූ ඉල්ලුම සැපිරීම සඳහා, විශේෂයෙන් පෞද්ගලික අංශයේ ප්‍රමුඛ සහභාගිත්වය සහිතව, වැඩි අරමුදල් ප්‍රමාණයක් ඒකරාශී කළ යුතුවේ.

(iv) නවෝත්පාදන, රැකියා උත්පාදනය හා එකතු කළ වටිනාකම් සහිත නිෂ්පාදිත ඉලක්ක කර ගනිමින්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය, සහනදායී ණය ලබා දීමෙන් ශක්තිමත් කරනු ඇත. තවද, අපනයන අංශය ඉලක්ක කර ගත් නිෂ්පාදිත පුළුල් කිරීමට පහසුකම් සපයනු ඇත.

## 7. 2018 වසර සඳහා අයවැය ප්‍රතිපාදන සැලසීම

පසුගිය වර්ෂයන්හිදී මූලධන වියදම් උපයෝජනය පෙනෙන අයුරින් ප්‍රමාණවත් නොවන පසුබිමක, 2018 වසර සඳහා අයවැය ප්‍රතිපාදන වඩා යථාතුරූපී ලෙස වෙන් කරනු ඇත. එමනිසා වැය දරනු ලබන සියළුම ආයතන විසින් වියදම් ඇස්තමේන්තු සැකසීමට පෙර පහත සඳහන් පියවරයන් අනුගමනය කළ යුතුය.

(i) දැනට ක්‍රියාත්මක වෙමින් පවතින හා විදේශ මූල්‍යාධාර සහිත ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාව දෙනු ලබන අතර එහිදී එක් එක් ව්‍යාපෘතිය සඳහා මිනිය හැකි ප්‍රතිඵල මත ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුනාගත යුතුය.

(ii) දැනටමත් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් ඇගයීමට ලක්කර හා ව්‍යාපෘති ලැයිස්තුවේ (pipeline) ඇති නව මූලධන ව්‍යාපෘති, දැනටමත් ක්‍රියාත්මක හා විදේශ මූල්‍යාධාර සහිත ව්‍යාපෘතිවලට ප්‍රමුඛතාව දීමට යටත්ව, වියදම් ඇස්තමේන්තු කෙටුම්පතට ඇතුලත් කළ හැකිය.

(iii) මෙයට අමතරව, ජාතික වැදගත්කමක් ඇති හා ඉක්මන් අවධානය යොමු විය යුතු ව්‍යාපෘති වේ නම් ඒවාද වියදම් ඇස්තමේන්තු කෙටුම්පතට ඇතුලත් කළ හැකිය. කෙසේ වුවද, සම්පත් වෙන් කරනු ලබන්නේ 2018 වසර සඳහා පවතින සම්පත් ප්‍රමාණය සැලකිල්ලට ගැනීමෙනි. එවැනි නව මූලධන වියදම් ව්‍යාපෘති සඳහා භව්‍ය අංශ (Potential areas) ලෙස, වෙනත් අංශ ද ඇතුලත්ව, පහත අංශ ඇතුලත් වේ.

(අ) වටිනාකම එකතු කිරීම වැඩිකෙරෙන අපනයන නිෂ්පාදන

(ආ) කසල කළමනාකරණය
(ඇ) තරුණ තරුණියන්ට රැකියා උත්පාදනය
(ඈ) නාගරික හා ග්‍රාමීය ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය
(ඉ) සංචාරක ව්‍යාපාරය වැඩිදියුණුවට අදාල කර්මාන්ත

ව්‍යාපෘති ප්‍රමුඛතාකරණය සිදු කරනු ලබන්නේ සමීපස්ථ සමාජ - ආර්ථික අවශ්‍යතා මෙන්ම මධ්‍ය කාලීන හා දිගු කාලීන ආර්ථික සංවර්ධන අරමුණු සැලකිල්ලට ගනිමිනි. තවද, මූලධන ආයෝජනවලින් ප්‍රතිලාභ ලබා ගැනීමට ගත වන කාලය (ව්‍යාපෘති සංවර්ධන කාලය) පිළිබඳව ද අවධානයක් යොමු කරනු ඇත. කෙටි කාලීන මෙන්ම මධ්‍ය කාලීන හා දිගු කාලීන ප්‍රතිලාභ ගෙන එන ආකාරයෙන් ව්‍යාපෘති මිශ්‍රයේ නිසි තුලනයක් මගින් රජයේ මුදල් ප්‍රවාහ කළමනාකරණයේ සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ තිරසර බව ශක්තිමත් කරනු ඇත.

**8. වියදම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

අදාළ සියළුම උපලේඛන සමඟ පිළියෙල කළ වියදම් ඇස්තමේන්තුවල දෘඩ පිටපත් 2017 අගෝස්තු 04 දින හෝ ඊට ප්‍රථම ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතුවේ. මීට අමතරව, එම ලේඛනවල මෘදු පිටපත් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අදාල මාණ්ඩලික නිලධාරියා වෙත විද්‍යුත් තැපෑලෙන් යැවිය යුතුවේ. වියදම් ඒකක සමඟ කෙරෙන පූර්ව අයවැය සාකච්ඡා 2017 අගෝස්තු දෙවන සතියේ සිට ආරම්භ කෙරේ.

**09. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**

ඇමුණුම II හි ලබාදී ඇති ආකෘතිය අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් ඇස්තමේන්තු ඉදිරිපත් කළ යුතුවේ.

**10. පැහැදිලි කර ගැනීම්**

මේ සම්බන්ධයෙන් යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වේ නම් ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ආයතනය සමඟ කටයුතු කරන ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අදාළ නිලධාරියා ඇමතීමට කටයුතු කිරීමට කාරුණික වන්න.

**අ/කළේ: ආර්.එච්.එස්.සමරතුංග**
භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත් ;

I. ජනාධිපති ලේකම්
II. අග්‍රාමාත්‍ය ලේකම්
III. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
IV. විගණකාධිපති

ඇමුණුම 1

<u>තිරසර සංවර්ධන අරමුණු</u>

නව තිරසර සංවර්ධන වැඩසටහනේ අංගයක් ලෙස දිළිදුකම තුරන් කිරීම, පෘථිවිය ආරක්ෂා කිරීම සහ සෞභාග්‍ය සුරක්ෂිත කිරීම ආදී අරමුණු ලඟා කර ගැනීමට 2015 සැප්තැම්බර් මස 25 වන දින රටවල් එකඟතාවය පලකරන ලදි. සෑම අරමුණකටම ඉදිරි වසර 15 ක කාලය තුළදී ළඟා කර ගත යුතු විශේෂිත ඉලක්කයන් පවතී. අරමුණු කරා ළඟාවීම සඳහා රජයන්, පෞද්ගලික අංශය, සිවිල් සමාජය සහ සමස්ථ පුරවැසියන්ම තමාගේ යුතුකම් ඉටුකිරීම අපේක්ෂා කෙරේ.

| | | |
|---|---|---|
| 1 වන අරමුණ | : | දරිද්‍රතාවයෙන් තොරවීම |
| 2 වන අරමුණ | : | කුසගින්න තුරන් කිරීම |
| 3 වන අරමුණ | : | නිරෝගී බව සහ යහපැවැත්ම |
| 4 වන අරමුණ | : | ගුණාත්මක අධ්‍යාපනය |
| 5 වන අරමුණ | : | ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය |
| 6 වන අරමුණ | : | පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව |
| 7 වන අරමුණ | : | දැරිය හැකි පිවිතුරු බලශක්තිය |
| 8 වන අරමුණ | : | සුනිසි මෙහෙවර සහ ආර්ථික වර්ධනය |
| 9 වන අරමුණ | : | කර්මාන්ත, නවෝත්පාදන සහ යටිතල පහසුකම් |
| 10 වන අරමුණ | : | අසමානාත්මතා අවම කිරීම |
| 11 වන අරමුණ | : | තිරසාර නගර සහ ප්‍රජාවන් |
| 12 වන අරමුණ | : | වගකීමෙන් යුතු පරිභෝජනය සහ නිෂ්පාදනය |
| 13 වන අරමුණ | : | දේශගුණික ක්‍රියාකාරකම් |
| 14 වන අරමුණ | : | ජලය තුළ ජීවය |
| 15 වන අරමුණ | : | ගොඩබිම මත ජීවය |
| 16 වන අරමුණ | : | සාමය,යුක්තිය සහ ශක්තිමත් ආයතන |
| 17 වන අරමුණ | : | තිරසාර සංවර්ධනය සඳහා පාර්ශවයන් |

මූලාශ්‍රය: http://www.un.org/sustainabledevlopment/sustainable-development-goals/

ඇමුණුම **2**

**<u>2018 අයවැය ඇස්තමේන්තු - රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්</u>**

1. අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම:-..........................
2. අත්තිකාරම් "බී" ගිණුමේ විෂය අංකය :- ....................
3. 2017 ජූනි මස තොරතුරුවලට අනුව :- ................

    I. උත්සව අත්තිකාරම් ලැබීමට හිමිකම් ඇති නිලධාරීන් ගණන:- ..........................
    II. විශේෂ අත්තිකාරම් ලැබීමට හිමිකම් ඇති නිලධාරීන් ගණන :- ...........................
    III. ආපදා ණය ලැබීමට හිමිකම් ඇති නිලධාරීන් ගණන:- ....................................
    IV. 2017 ජූනි මස වැටුපෙන් අඩුකර රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමට බැර කළ ණය වාරිකවල වටිනාකම:- ......................................................
    V. 2017 ජූනි මස වැටුප් සඳහා වූ වියදම (වැය විෂය අංක 1001 අනුව) :- ................

4. රා.ප.චක්‍රලේඛ අංක 3/2016 අනුව 2018 ජනවාරි මස ගෙවීමට අපේක්ෂිත වැටුප (වැය විෂය අංක 1001 අනුව) :- .........................................

5. 2016 වර්ෂයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සැසඳීම් ප්‍රකාශ අනුව

    I. මුළු වියදම (011 යටතේ) :- ....................................
    II. මුළු ලැබීම් (011 යටතේ) :- .....................................
    III. දෙසැම්බර් 31 දිනට හර ශේෂය :- ....................................

6. 2018 වර්ෂය සඳහා ඔබ විසින් යෝජනා කරනු ලබන සීමාවන්

    I. උපරිම වියදම් සීමාව (011) :- ....................................
    II. අවම ලැබීම් සීමාව(011) :- ....................................
    III. උපරිම හර ශේෂ සීමාව :- ...................................

...............................................

දිනය:- ............................ ආයතන ප්‍රධානියාගේ අත්සන